# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/74 - 2024 සැප්තැම්බර් මස 28 වැනි සෙනසුරාදා - 2024.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : KES/DS/LND/ACI/SAMURDI BANK.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අවශ්‍ය මහජන කාර්යය:- මඩපාත සමෘද්ධි ප්‍රජාමූල බැංකුව ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම සඳහා

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටකැත්තර උතුර ගමේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 521208 හි කලාප අංක 04 පත්‍ර අංක 05 හි සඳහන් ඉඩම් කැබලි 01න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0269 වන පහත විස්තර කෙරෙන ඉඩම :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: ද මැල්වත්ත, වරිපනම් අංකය සොයාගත නොහැක, මඩපාත පාර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි දෙකක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0269.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් **2024 නොවැම්බර් මස 04** වැනි දින පෙ.ව. **10.00** ට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2024** නොවැම්බර් මස **01** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. පී. පේමදාස,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කැස්බෑව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0210



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කැප්‍රාලේ/අත් 3/1/58.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2007/HA/230.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 2065/4 දරන 2018.04.02 හා අංක 2354/27 දරන 2023.10.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පළකරන ලද 7 වන වගන්තියේ දැන්වීම පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :- කැස්බෑව ප්‍රාදේශීය ලේකම් නිල නිවස ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 576 තුම්බෝවිල බටහිර ග්‍රාම නිලධාරි වසමේ තුම්බෝවිල ගමේ පිහිටි කැඩැස්තර සිතියම් අංකය 521203 ලෙස නිවැරදි විය යුතු ය.

කේ. පී. පේමදාස,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම්
අත්කර ගැනීමේ නිලධාරි,
කැස්බෑව.

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09 - 0211

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.